# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2082/65 – 2018 අගෝස්තු 03 වැනි සිකුරාදා – 2018.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තු බටහිර කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 1525, නාබිරිත්තන්කඩවර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වඩුමුන්නේගෙදර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේඩු/පීඑන්එන්/2017/290 හා 2017.09.29 දිනැති ප්‍රමාණයෙන් හෙක්. 0.8121ක් පමණ වන පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – හොරතැපොලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.8121ක් පමණ

උතුරට: ඒ. පී. උපනන්ද හිමිකම් කියන හොරතැපොලවත්ත සහ හිමිකම් කියන අය නොදන්නා නාගතෝට්ටම් වත්ත; නැගෙනහිරට: හිමිකම් කියන අය නොදන්නා නාගතෝට්ටම් වත්ත සහ ඩී. එස්. එච්. ලූෂන් පෙරේරා හිමිකම් කියන නාගතෝට්ටම් වත්ත; දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: ඒ. පී. උපනන්ද හිමිකම් කියන හොරතැපොලවත්ත.

ගයන්ත කරුණාතිලක,<br>ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2017/එල්ඕ/54.<br>2018 මැයි මස 09 වැනි දින,<br>ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,<br>"මිහිකත මැදුර",<br>රජමල්වත්ත පාර,<br>බත්තරමුල්ල.

08 - 690

1A – G28229 – 12 (2018/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*